# පුරාණ බෞද්ධ සමාජයන්හි ස්ත්‍රීත්වය නිරූපණයෙහි ලා ජාතක කතාවේ දායකත්වය පිළිබඳ ව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.එම්. සිහින සඳරුවන්[1] එම්.එච්.එච්. හිල්මියා[2]*

සමාජ සාරධර්ම රාශීයක් ඉදිරිපත් කරන බුදු දහම විමුක්ති මාර්ගයක් පමණක් නො ව සමාජ සාරධර්ම රාශියක් ද ඉදිරිපත් කරන අතර එහෙයින් බුදු දහම සමාජ දර්ශනයක් වන බව හඳුනාගත හැකි ය. මූලික වසයෙන් බුදුදහම විමුක්ති මාර්ගයක් වුව ද ස්ත්‍රීත්වය, පුරුෂත්වය වැනි විෂයන් ද සාකච්ඡා කර තිබෙන අතර බෞද්ධ පොත්පත්වල ස්ත්‍රී භාවය සහ පුරුෂ භාවය පිළිබඳ ව දාර්ශනික මට්ටමෙන් සාකාච්ඡා කෙරෙයි. මානව සංහතියේ පැවැත්ම කෙරෙහි බලපාන ප්‍රධානතම ජීවී සාධකය වන ස්ත්‍රිය පිළිබඳ ව විවිධ මතිමතාන්දර සහ අදහස් ගණනාවක් විවරණය කරන බුදුදහම ස්ත්‍රිය කෙරෙහි සමාජයේ පැවැති දෘෂ්ටිය 'ජාතක කථාව' මූලික කර ගනිමින් කාන්තාවන්ගේ භූමිකාවත්, ගුණාංග සහ ඔවුන් හා සම්බන්ධ සමාජ වටිනාකමුත් නිරූපණය කෙරේ. ඒ අනුව පුරාණ බෞද්ධ සමාජයන්හි ස්ත්‍රීත්වය සැලකූ ආකාරය කෙබඳු ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ගැටලුව වූ අතර ජාතක කතා තුළ ස්ත්‍රීත්වය නිරූපණය වන්නේ කෙසේ ද සහ මෙම කතා රචනා කරන කාලය තුළ බෞද්ධ චින්තනයේ සහ සමාජයේ කාන්තාවගේ භූමිකාව, තත්ත්වය කෙසේ ද යන්න හඳුනා ගැනීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණු වේ. මෙහි දි මෙම අධ්‍යයනයට ගුණාත්මක පරියේෂණ ක්‍රමවේදය භාවිත කළේ ය. එහි දී දත්ත රැස් කිරීමට ද්විතියික මූලාශ්‍රය ක්‍රමය යටතේ මේ සම්බන්ධයෙන් රචනා වී ඇති පොත් පත්, පුවත් පත්, සඟරා මෙන් ම අන්තර්ජාලය ආශ්‍රිත ලිපි ද භාවිත කරන ලදි. විශේෂයෙන් ම මේ සඳහා ජාතක පොතේ සඳහන් ජාතක කතා මුල් කර ගනිමින් දත්ත රැස් කළ දත්ත විශ්ලේෂණය කළ අතර සංසන්දනාත්මක ව බාහිර කෘතීන් ද අධ්‍යයනය කරන ලදි. දත්ත විශ්ලේෂණයේ දි ස්ත්‍රිය පිළිබඳ ව ජාතක පොත මඟින් ආකල්පයන් ගණනාවක් නිරූපණය කර තිබෙන බව හඳුනාගත හැකි විය. එනම් ස්වාමි භක්තිය, සුවච බව, ස්ථානෝචිත ප්‍රඥාව, මාතෘත්වය, කාන්තා දුර්ගුණ ද වෙයි. ස්ත්‍රීන්ට හිමි වූ ලිංගික නිදහස පිළිබඳ ව ද විවරණය කරන ජාතක කථාව ස්ත්‍රියට ආවේණික කාමුකත්වය, අනාචාරයේ හැසිරීම, තෘෂ්ණාවෙන් යුක්ත වීම, කපටි බව, සැක සහිත බව, අහංකාරය නිරූපණය කළ ඇති බව දැකිය හැකි ය. ජාතක කතා තුළින් භක්තිමත් සහ ගුණවත් කාන්තාවන්ගේ සිට සමාජ තත්ත්වයන්ට අභියෝග කරන විවිධාකාර කාන්තා චරිත විශ්ලේෂණය කර ඇති බවත්, කාන්තා භූමිකාවේ බහුවිධ ස්වභාවයත් නිරූපණය කර තිබෙනු දැකිය හැකි ය. කාන්තාවන් ප්‍රඥාවන්ත, දයානුකම්පිත හා අධිෂ්ඨානශිලි චරිත ලෙස පෙන්වා දෙමින් 'කාන්තාවන් නිෂ්ක්‍රිය චරිත' ලෙස වටහා ගැනීම අභියෝගයට ලක් කර තිබීම ද හඳුනාගත හැකි ය. මෙම පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේ දි එළඹිය හැකි අවසාන නිගමනය වුයේ ජාතක කතාව මගින් නිරූපණය කරන ස්ත්‍රියගේ ආකල්ප සරල නොවූ සංකීර්ණ ස්වභාවයක් ගන්නා බවත් කාන්තාවන්ගේ භූමිකාව බහුවිධ ස්වරූපයක් ගන්නා බවත් වෙයි.

***ප්‍රමුඛ පදඃ*** බුදු දහම, ජාතක කථා, ස්ත්‍රිය, භූමිකාව, සංකීර්ණ.

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. sihinasandaruwan2000@gmail.com

[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. hairulhilmiya02@gmail.com